සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 1

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 ජූලි මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## උපන් දිනයට බෝධි පූජා පින්කමක් 11- කොටස

ආදරණීය දුවේ පුතේ අපි කලින් දවසේ අපේ උපන් දිනයට බෝධි පූජා පින්කමක් කිරීමට අවශ්‍ය දේවල් හා බෝධි පූජාවක් පැවැත්වීමට පෙර අප කළ යුතු දේ මොනවාදැයි කතා කළා මතකයි නේද?

ඒ වගේම අපි බොදු වදන් කීපයක්ම ඉගෙන ගත්තා මතකයි නේද? බලමු මගේ පුතාලට මතකයි නේද කියලා.එහෙනම් කියන්න බලන්න ඔයාලා ඉගෙන ගත් බොදු වදන් මොනවාද කියලා.

හරි මගේ දුවේ පුතේ බෝධි පූජාව අවසානයේදී පිරිකර පූජා කළා.පිරිත් සජ්ඣායනා කළා.ඉතින් මගේ පුතේ බෝධි පූජාව අවසානයේ දී පොඩි හාමුදුරුවන්ට වන්දනා කළා නේද?

1). අපි ස්වාමීන් වහන්සේට වන්දනා කරන ගාථාව නිවැරදිව ලියමු නේද දරුවනේ.

2). දුවේ පුතේ ඔයාලගේ අම්මාටයි තාත්තාටයි වන්දනා කරන ගාථා දන්නවා නේද?අපි එම ගාථාත් ලියමු නේද?

- මවට වඳින ගාථාව
- පියාට වඳින ගාථාව

3).අපි පෙළපොතේ අදාළ අභ්‍යාස වලටත් පිළිතුරු ලියමු නේද මගේ දරුවනේ.

4).රන්වන් පාටින් දළුලන බෝධිය කවිය හඬනගා තාලයට ගායනා කරමු නේද මගේ දරුවනේ.

ඉතින් මගේ දුවේ පුතේ අපිත් අපේ උපන් දිනයට බෝධි පූජාවක් පවත්වමු.සංඝයා වහන්සේට,මවට,පියාට ගාථා කියා වන්දනා කරමු.

බුද්ධ ධර්මය විෂයට අදාළ වීඩියෝ enanapiyasa වෙබ් අඩවියේ සුහුරු පාඩම් යටතේ ලබාගත හැකිය